


# දකුණු පළාත් සභාව
தென் மாகாண சபை
## SOUTHERN PROVINCIAL COUNCIL

**අධ්‍යාපන, ඉඩම් හා ඉඩම් සංවර්ධන, මහා මාර්ග හා ප්‍රවෘත්ති අමාත්‍යාංශය**
கல்வி, காணி மற்றும் காணி அபிவிருத்தி, லைகவ் மற்றும் தகவல்நெடுஞ்சா துறை அமைச்சு
**Ministry of Education, Land & Land Development, Highways & Information**

**බිම් මහල, "දක්ෂිණ පාය", ලබුදූව, ගාල්ල.** கீழ் மாடி, "தக்சிண பாய", லபுகுவ, காலி, Ground Floor, "Dakshina Paya", Labuduwa, Galle.


| | | |
|---|---|---|
| මගේ අංකය / எனது இல / My No. } Sp/Edumin/Edu/4/1 | ඔබේ අංකය / உனது இல / Your No. } | දිනය / திகதி / Date } 2024.03.07 |

ලිඛිත තරඟ විභාගය සමත් වූ සියලුම උපාධිධාරීන් වෙත,

**<u>දකුණු පළාත් සභා පාසල්වල පවතින සිංහල, දෙමළ හා ඉංග්‍රීසි මාධ්‍ය ගුරු පුරප්පාඩු සඳහා උපාධිධාරීන් ශ්‍රී ලංකා ගුරු සේවයේ 3 වන පන්තියේ 1 (අ) ශ්‍රේණියට බඳවා ගැනීම සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණය සහ ප්‍රායෝගික පරීක්ෂණය සම්බන්ධවයි</u>**

උක්ත කරුණට අදාළව දකුණු පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව මගින් නිකුත් කරන ලද ලිඛිත තරඟ විභාගයේ ප්‍රතිඵල මත විභාග නිවේදනයේ සඳහන් පරිදි සුදුසුකම් පරික්ෂා කිරීම සඳහා වන සම්මුඛ පරීක්ෂණයන් සහ ප්‍රායෝගික පරීක්ෂණයන් 2024.03.15 දින සිට ආරම්භ කිරීමට අපේක්ෂිත අතර, එය **දක්ෂිණපාය අමාත්‍යාංශ සංකීර්ණයේ දී** (පළමු මහල, දක්ෂිණපාය අමාත්‍යාංශ සංකීර්ණය, ලබුදූව, ගාල්ල.) පැවැත්වීමට කටයුතු සූදානම් කර ඇත. ඒ අනුව එදිනට පහත සඳහන් සහතික හා ලිපිලේඛනවල මුල් පිටපත් රැගෙන සම්මුඛ පරීක්ෂණයට පෙනී සිටින ලෙස ඔබට මෙයින් දන්වමි. එමෙන්ම එම සහතිකයන්හි ඡායා පිටපත්, **ඔබ විසින් සත්‍ය පිටපත් බවට සහතික කර,** එම සහතික කාඩ්බෝඩ් ලිපිගොනුවක පහත අනුපිළිවෙළ අනුව සකස් කර රැගෙන ආ යුතු අතර, එම ලිපිගොනුවේ මුහුණතෙහි **ඔබගේ අනු අංකය** (වෙබ් අඩවියෙහි පළ කර ඇති ඔබේ නමට අදාළ අනු අංකය), **ඔබගේ විභාග අංකය, ඔබගේ මුලකුරු සමග නම, ඔබගේ ජා.හැ.අංකය හා පදිංචි ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය** වම් පස ඉහළ කෙළවරේ සඳහන් කළ යුතුය.

1. ජාතික හැඳුනුම්පත සහ උප්පැන්න සහතිකය (නමේ වෙනසක් ඇතොත් දිවුරුම් ප්‍රකාශයක් ද ඉදිරිපත් කළ යුතුය.)
2. අ.පො.ස.(සා.පෙළ/උ.පෙළ) සහතිකවල මුල්පිටපත්
3. උපාධි සහතිකය හා විස්තරාත්මක උපාධි සහතිකය මුල් පිටපත් (Degree Certificate and Detail Certificate)
4. මාස 06 ක් ඇතුළත ලබාගත් චරිත සහතික දෙකක් (මින් එකක් ඔබ **පදිංචි ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ ග්‍රාම නිලධාරීගෙන් ලබා ගත යුතු ය.** )
5. **ඔබගේ පදිංචිය තහවුරු වන පරිදි ග්‍රාම නිලධාරී සහතිකය** (DS 04) **ඉදිරිපත් කළ යුතුය. එහි ඔබේ ලිපිනය හා පදිංචිය කවදා සිට ද යන වග සඳහන් විය යුතු ය.)**

   **එහිදී ඔබ අයදුම් කරනු ලබන්නේ කලත්‍රයාගේ පදිංචිය මත නම්** කලත්‍රයාගේ පදිංචිය තහවුරු වන ග්‍රාම නිලධාරී සහතිකය සමග විවාහ සහතික ඉදිරිපත් කළ යුතු වේ. (ඔබගේ ස්ථිර පදිංචිය දකුණු පළාතට ගෙන ඒම සිදු කර ඇත්නම් කලත්‍රයාගේ පදිංචිය තහවුරු වන ග්‍රාම නිලධාරී සහතිකය සමග ඔබගේ පදිංචිය සනාථ වන ග්‍රාම නිලධාරී සහතිකය ද ඉදිරිපත් කළ යුතු ය. මේ වන විටත් ඔබගේ පදිංචිය දකුණු පළාතට ගෙන ඒමක් සිදු කර නැත්නම් එය කඩිනමින් ගෙන එන බවට ප්‍රකාශ කරමින් දිවුරුම් ප්‍රකාශයක් ඉදිරිපත් කළ යුතු වේ.)


ගරු අමාත්‍යතුමා / கௌரவ அமைச்சர் / Hon. Minister } 091-2246159
ලේකම් / செயலாளர் / Secretary } 091-2246156, 091-2030701
කාර්යාලය / காரியாலயம் / Office } 091-2030708පාලන/நிர்வாகம்/Administration, 091-2030705අධ්‍යාපන/கல்வி/Education, 091-2030703සැලසුම්/திட்டமிடல்/Planning, 091-2030702...
ෆැක්ස් / பெக்ஸ் / Fax } 091-2246157, 091-2246156, 091-2234044

6. එමෙන්ම ඉහත දක්වා ඇති සියලුම ලේඛන සුදුසුකම් පරීක්ෂණ දිනයේදීම ඉදිරිපත් කළ යුතු අතර, පසුව **ඉදිරිපත් කරනු ලබන ලේඛන කිසිවක් භාරගනු නොලැබේ.**
7. ඔබ විසින් අයදුම් කරන ලද විෂයයකට අදාළ ව පහතින් දක්වා ඇති පරිදි මිනිත්තු 05ක කාලයක් තුළ තෝරා ගත් මාතෘකාවක් යටතේ ඉදිරිපත් කිරීමක් කළ යුතු ය. ඔබ විසින් සිදු කරනු ලබන ඉදිරිපත් කිරීම සඳහා Microsoft PowerPoint Presentations කිසිසේත් යොදා ගත නොහැකි අතර පංති කාමර තුල සිදු කෙරෙන ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රමවේදය අනුව ඉගෙනුම් උපකරණ භාවිතා කරමින් ඉදිරිපත් කිරීම සිදු කළ යුතු වේ.
8. සම්මුඛ පරීක්ෂණයෙන් සමත් වන අයදුම්කරුවන් පමණක් ප්‍රායෝගික පරීක්ෂණ සඳහා යොමු කරනු ලැබේ.
9. සම්මුඛ හා ප්‍රායෝගික පරීක්ෂණය සඳහා ඔබට නියමිත වේලාවට මිනිත්තු 15 කට පෙර දක්ෂිණපාය අමාත්‍යාංශ සංකීර්ණය වෙත පැමිණීම අනිවාර්යය වේ.
10. සම්මුඛ හා ප්‍රායෝගික පරීක්ෂණයන් සඳහා කැඳවීම, පත්වීම් ලබා දීම සඳහා සුදුසුකමක් ලෙස කිසිසේත් නොසැලකිය යුතු ය.
11. සම්මුඛ හා ප්‍රායෝගික පරීක්ෂණ සඳහා ඔබ පැමිණිය යුතු දිනය, වේලාව හා ඔබට අදාළ සම්මුඛ පරීක්ෂණ මණ්ඩල අංකය පිළිබඳ විස්තර ඉදිරි දින කිහිපය තුල මෙම වෙබ් අඩවියෙන් ලබා ගත හැකි බව ද කාරුණික ව දැනුම් දෙමි.

රංජිත් යාපා
ලේකම්
අධ්‍යාපන, උසස් හා වෘත්තීය අධ්‍යාපන,
මහා මාර්ග හා ඉඩම් නිෂ්පාදන අමාත්‍යාංශය
බත්තරමුල්ල.

රංජිත් යාපා
ලේකම්.

<u>**ප්‍රායෝගික පරීක්ෂණ ක්‍රමවේදය:**</u>

(i). ප්‍රායෝගික පරීක්ෂණය සඳහා කාලය විනාඩි 5කට නොඅඩු කාලයක් ලබා දෙනු ලබන අතර නිර්ණායකයන්හි අරමුණු පහත පරිදි වේ.

**නිර්ණායකයන්හි අරමුණු:**

| | | |
|---|---|---|
| i | අරමුණ හා ප්‍රවිශ්ට වීම | සාර්ථකව පාඩමෙහි අරමුණු පැහැදිලි කිරීම හා පාඩමට ප්‍රවිශ්ට වීමේ හැකියාව ඇගයීම. |
| ii | පෞරුෂය හා හඬ පාලනය | ගුරුවරයෙකු ලෙස මනා පෞරුෂයකින් යුතු වීම හා ඉගැන්වීමේ දී මනා ලෙස හඬ පාලනය කිරීමේ හැකියාව ඇගයීම. |
| iii | සන්නිවේදනයේ පැහැදිලි බව | ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලියේ දී අදාළ කරුණු ඵලදායී ලෙස සන්නිවේදනය කිරීමේ හැකියාව ඇගයීම. |
| iv | කාල කළමනාකරණය | ලබා දෙනු ලබන කාලසීමාව තුළ අරමුණු කෙරෙහි ළඟා වීමේ කුසලතාවය ඇගයීම. |
| V | ඉදිරිපත් කිරීමේ ශිල්ප ක්‍රම භාවිතය | අරමුණු කෙරෙහි ළඟා වීම සඳහා ඉදිරිපත් කිරීමේ ශිල්ප ක්‍රම මනා ලෙස භාවිත කිරීමේ හැකියාව ඇගයීම. |

(ii). මේ සඳහා පහත පරිදි ලකුණු හිමි වේ.

| අනු අංකය | ප්‍රායෝගික පරීක්ෂණයේ දී ලකුණු ලබා දෙනු ලබන නිර්ණායක | උපරිම ලකුණු ප්‍රමාණය | සමත් වීමට අවශ්‍ය අවම ලකුණු ප්‍රමාණය |
|---|---|---|---|
| 01. | අරමුණු හා ප්‍රවිශ්ට වීම. | 05 | 02 |
| 02. | පෞරුෂය හා හඬ පාලනය | 05 | 02 |
| 03. | සන්නිවේදනයේ පැහැදිලි බව | 05 | 02 |
| 04. | කාල කළමනාකරණය | 05 | 02 |
| 05. | ඉදිරිපත් කිරීමේ ශිල්පක්‍රම භාවිතය | 05 | 02 |
| | මුළු ලකුණු ප්‍රමාණය | 25 | 10 |